# ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රය

1975 අප්‍රේල් 11 වන දින

II වන කොටස

## අතිරේකය

(75. 04. 22 දින නිකුත් කරන ලදි)


# මහවැලි සංවර්ධන මණ්ඩල (සංශෝධන)

**1970 අංක 14 දරන මහවැලි සංවර්ධන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනත් කෙටුම්පතකි.**

වාරිමාර්ග, විදුලිබල හා මහාමාර්ග අමාත්‍යවරයාගේ නියමය පරිදි පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක.

## නීතිය බලපෑමේ ප්‍රකාශය

2 වන වගන්තිය: 1970 අංක 14 දරන මහවැලි සංවර්ධන මණ්ඩල පනතේ 3 වන වගන්තිය යටතේ දැනට මණ්ඩලයට පත් කරනු ලබන නිල බලයෙන් පත් වන සාමාජිකයන් අතුරින් සාමාජිකයන් සතර දෙනෙක් වාරි මාර්ග අමාත්‍යාංශයේ ලේකම්, කෘෂිකර්ම අමාත්‍යාංශයේ ලේකම්, මුදල් අමාත්‍යාංශයේ ලේකම් සහ ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ ලේකම් ‍වෙති. පනතේ 3 වන වගන්තියෙහි කරනු ලබන සංශෝධන මගින් ඉහත කී අමාත්‍යාංශ භාර එක් එක් අමාත්‍යවරයාට ස්වකීය අමාත්‍යාංශයෙන් එක් නියෝජිතයකු ලේකම් වෙනුවට හා එයට අතිරේකව රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යවරයාට ස්වකීය අමාත්‍යාංශයෙන් එක් නියෝජිතයකු පත් කිරීමට හැකි වනු ඇත.

තව ද, පරිපාලන දිස්ත්‍රික්කවල දිසාපතිවරුන් සහ විදුලිබල මණ්ඩලයේ නියෝජිතයකු මණ්ඩලයේ සාමාජිකයන්ව සිටීම අවසන් වනු ඇත.

1—ඒ 12687—6,985 (75/02)

එල්. ඩී.—ඕ. 55/73

**1970 අංක 14 දරන මහවැලි සංවර්ධන මණ්ඩල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක   දරන මහවැලි සංවර්ධන මණ්ඩල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. 1970 අංක 14 දරන මහවැලි සංවර්ධන මණ්ඩල පනතේ 3 වන වගන්තිය පහත සඳහන් පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— 1970 අංක 14 දරන පනතේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය—

(අ) ඒ උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද වෙනුවට පහත සඳහන් අලුත් ඡේද ආදේශ කිරීමෙන් :—

" (අ) ඉංජිනේරු විද්‍යාවෙහි, කෘෂිකර්මයෙහි, විද්‍යාවෙහි, වාණිජ විද්‍යාවෙහි, පරිපාලනයෙහි හෝ ගණකාධිකරණයෙහි පළපුරුද්දක් ලබා ඇති හා ප්‍රවීණත්වයක් දක්වා ඇති තැනැත්තන් අතුරින් අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන, මෙහි මින් මතු 'පත් කළ සාමාජිකයෝ' යනුවෙන් සඳහන් කරනු ලබන, සාමාජිකයන් තුන්දෙනෙක් ; සහ

(ආ) (i) ක්‍රම සම්පාදන හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නිලධරයකු වන නියෝජිත සාමාජිකයෙක් ;

(ii) වාරිමාර්ග, විදුලි බල හා මහා මාර්ග අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නිලධරයකු වන නියෝජිත සාමාජිකයෙක් ;

(iii) මුදල් අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නිලධරයකු වන නියෝජිත සාමාජිකයෙක් ;

(iv) කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නිලධරයකු වන නියෝජිත සාමාජිකයෙක් ;

(v) රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය භාර අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන ඒ අමාත්‍යාංශයේ නිලධරයකු වන නියෝජිත සාමාජිකයෙක් ;

(vi) වාරිමාර්ග අධ්‍යක්ෂ ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා ;

(vii) කෘෂිකර්ම අධ්‍යක්ෂ ධුරය තත් කාලයෙහි දරන තැනැත්තා ;

(viii) ඉඩම් කොමසාරිස් ධුරය තත් කාලයෙහි කරන තැනැත්තා

වන, නිල බලයෙන් පත් වන සාමාජිකයන් අට දෙනෙක්,"; සහ

(ආ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදය අත් හැරීමෙන් ; සහ

(2) ඒ වගන්තියේ (13) වන උපවගන්තිය අත් හැරීමෙන්.